# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/27 - 2022 දෙසැම්බර් මස 14 වැනි බදාදා - 2022.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 18 සහ 19 වන වගන්ති සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රොෂාන් රණසිංහ (පා.ම.),  
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 14 වැනි දින,  
කොළඹ දී ය.

නියෝගය

1976 නොවැම්බර් මස 30 වැනි දින. අංක 241/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ 1986 ජනවාරි මස 20 වැනි දින අංක 385/7A දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* හා 1993 ජුනි මස 29 වැනි දින අංක 773/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කිරීමට යෙදුණු, ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටු නියෝගවල 9 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නව නියෝග ඇතුළත් කරමින් එකී නියෝග තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

10. ජාතික ඔලිම්පික් කමිටුවේ සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික තනතුරු තුනෙන් කුමන හෝ තනතුරක ධුර දැරිය හැකි උපරිම කාල එකතුව හෝ එකී තනතුරු දෙකක සමස්ථ සේවා කාල එකතුව ධුර කාල දෙකක් (02) එනම් වසර අටක් (08) විය යුතු ය.

එසේ වුවද, මෙම නියෝග බලාත්මක වන දින වන විට නිලවරණයෙන් තේරී පත් වී ඇති ධුරධාරීන් සම්බන්ධයෙන් ඔවුන් තේරීපත්ව ඇති ධුර කාලය අවසන් වන තෙක් එකී ධුර දැරීමට ඉහත නියෝගය බාධාවක් නොවිය යුතු ය.


1A - G 38348 — 07 (2022/12)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

11. ධුර කාල දෙකක් ධුර දරා ඇති කිසිදු සභාපතිවරයෙකු කිසිදු තනතුරකට නැවත තෝරාපත් කර ගැනීමට සුදුස්සකු නොවන නමුදු, කමිටු සාමාජිකත්වය දැරීමට නුසුදුස්සකු නොවිය යුතු ය.

12. ඕනෑම නිලධාරියෙකුගේ හෝ කමිටු සාමාජිකයකුගේ එකී ධුර කාලය දැරිය හැකි උපරිම වයස් සීමාව වයස අවුරුදු හැත්තෑව (70) දක්වා සීමා කරනු ලබන්නේ ය. එසේ වුවද, මෙම නියෝග බලාත්මක වන දින වන විට නිලවරණයෙන් තේරී පත්වී ඇති සභාපති ඇතුළු අනෙකුත් ධුරධාරීන් සම්බන්ධයෙන්, ඔවුන් තේරී පත්වී ඇති ධුර කාලය අවසන් වන තෙක් එකී ධුර දැරීමට මෙම නියෝගය බාධාවක් නොවිය යුතු ය.

EOG 12 - 0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.